# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෘතීය පරීක්ෂණය (බාහිර) - 2011/2012
2014 අප්‍රේල්/ මැයි/ ජූනි

සමාජීය විද්‍යා පීඨය

ජාත්‍යන්තර අධ්‍යයනය - **INTS - E3025**
ගෝලීයකරණය සහ සංවර්ධනය

<u>ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.</u>

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි                                   කාලය : පැය 03 යි

---

01. ගෝලීයකරණය යන සංකල්පය කුමක්දැයි කෙටියෙන් අර්ථ දක්වා එහි ක්‍රියාත්මක බලවේග පිළිබඳ විස්තරයක් කරන්න.

02. "ගෝලීයකරණයේ වාසි ඉක්මවා අවාසි වැඩෙමින් පවතී."සංවර්ධනය වෙමින් පවත්නා රටවල අත්දැකීම් ආශ්‍රයෙන් මෙම ප්‍රකාශය විවේචනාත්මකව විමර්ශනය කරන්න.

03. ආර්ථික ඒකාබද්ධකරණය යනු කුමක්දැයි පැහැදිලි කර එහි ක්‍රියාකාරිත්වය යුරෝපා ආර්ථික සංගමය ආශ්‍රයෙන් විමසන්න.

04. "ආර්ථික ලිහිල්කරණය ගෝලීයකරණයේ අනිවාර්ය අවශ්‍යතාවයකි." රටවල් විසින් අනුගමනය කරන ලද ආර්ථික ලිහිල්කරණ ප්‍රතිපත්ති ආශ්‍රයෙන් මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.

05. විද්‍යුත් වෙළඳාමේ මූලික ලක්ෂණ මොනවාදැයි පැහැදිලි කර විද්‍යුත් සේවා භාවිතයේ වාසි අවාසි විමසන්න.

06. 'තාක්ෂණ දියුණුව' සහ 'නවෝත්පාදන' යන සංකල්පය පැහැදිලි කර ආර්ථික සංවර්ධනයට ඒවා දක්වා ඇති දායකත්වය පිළිබඳ විස්තරයක් කරන්න.

07. මෑත කාලීන ගෝලීය ආර්ථික අර්බුදයේ බලපෑම සංවර්ධනය වන රටවල් ආශ්‍රයෙන් විමසන්න.

08. පහත සඳහන් මාතෘකා පිළිබඳව සටහන් ලියන්න.
    i. බහු පාර්ශවීය වෙළඳාම.
    ii. බහුජාතික සමාගම්.

**********************************